# කිරිගල්පොත්ත කන්ද (මහඑළිය තැන්න ඔස්සේ).

## කිරිගල්පොත්ත කන්ද නැගීමට උපදෙස්

**අරමුණ:** කිරිගල්පොත්ත  තරණය , රාවණා ගැන කියවෙන ස්ථාන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ඡායාරූප ගැනීම, කඳවුරු බැඳීම.

**දිනය :** 2014 පෙබරවාරි 14

**සහභාගීවුවන් ගණන:** 3 යි (නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, සෙන්තිවෙල් තුලසිදාස්)

**ගමන් කල ආකාරය:** බදුල්ල රාත්‍රී තැපැල් දුම්රිය, ත්‍රිරෝද රථ, පා ගමන්, පොදු ප්‍රවාහන බස් රථ මගින්

**ගමනේ ස්වභාවය:** ආරම්භක ස්ථානයේ සිට එතරම් අපහසුවකින් තොරව ගමන් කල හැක. එහෙත් දුර හා කඳු වල නැග්ම තරමක් අපහසුදායකය. ඔබ ශාරීරිකව නිරෝගීමත්ව සිටීම අත්‍යාවශ්‍ය වේ.

**ඇතුල්වීම:** මහ එළිය තැන්නට ඇතුළුවීමට ඇති දොරටුවලින් හෝ වන ජීවී කාර්යාල වලින් අවසර ලබා ඇතුළු විය යුතුය.

**විශේෂ ස්තූතිය:** ලසිත රත්නායක (මහඑළිය කඳවුරු බිම වෙන්කරවා ගැනීම)

**ඡායාරූප අනුග්‍රහය:** නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, සෙන්තිවෙල් තුලසිදාස්

**වාර්තාව සැකසුවේ:** නිශාන් කුළසිංහ විසිනි.

**ගමන් මාර්ගය**

කොළඹ කොටුව දුම්රිය ස්ථානය > ඔහිය දුම්රිය ස්ථානය >  මහඑළිය (හෝර්ටන්තැන්න)-ඔහිය පිවිසුම > කිරිගල්පොත්ත කන්ද > චිමිනි පොකුණ අසල අංක 3 කඳවුරු බිම > තොටුපළ කන්ද > හෝර්ටන් තැන්න පට්ටිපොළ පිවිසුම > පට්ටිපොළ > නුවරඑළිය > කොළඹ.




www.LakViskam.org

**නවාතැන් පහසුකම්**

බත්තරමුල්ල වනජීවී කාර්යාලය ඇමතීමෙන් හෝර්ටන්තැන්න තුල ඇති නිවාඩු නිකේතන හා කඳවුරු බිම් පිළිබඳව තොරතුරු ලබා ගත හැක (දුරකථන: 0112888585). ඒවා වෙන්කරවා ගැනීම එම කාර්යාල වලට ගොස් සිදු කර ගත යුතුය. මීට අමතරව වැලිමඩ ඔහිය මාර්ගයේ ඔහිය දුම්රිය ස්ථානය අසල ඇති පුද්ගලික නවාතැන් පලවල් වල නැවතිය හැක (දුරකථන: 057 4914266, 072 9126926 - ගාමිණී).

**පරිසරය පිළිබඳව**

මෙම ප්‍රදේශය කඳුකර, තද ශීත දේශගුණය සහිත (සමහර අවස්ථාවල උෂ්ණත්වය සෙල්සියස් අංශක 5 වැනි අගයන්ට අඩු විය හැක), නොඉඳුල් වලාකුළු වනාන්තර වලින් පරිපූර්ණ, ජල පෝෂක ප්‍රදේශයකි. මීදුමෙන්, වලාකුළෙන් වැසී යන හදිසි වර්ෂා ඇද හැලෙන,වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2000ට වැඩි, තද සුළං සහිත තෙත් ප්‍රදේශයකි. එහෙත් කුඩැල්ලන් එතරම් දක්නට නොමැත. ජල පහරවල්, ඝන වනාන්තර, සහිත ප්‍රදේශයකි. කුල 20කට අයත් වර්ග750 කට ආසන්න විවිධ පැළෑටි හා ශාඛ මෙහි දක්නට ඇත. කීන, දඹ, හා ගෝනුන් ආහාරයට ගන්නා ගවරමනා තෘණ පඳුරු එහි වේ. ක්ෂීරපායින් විශේෂ 24ක්, පක්ෂී විශේෂ 87ක්, උරග විශේෂ 9ක්, ආදී වශයෙන් පුළුල් විවිධත්වයකින් යුතු සත්ව ප්‍රජාවක්ද එහි වෙසෙයි. දිවියන්, ගෝනුන්, වල් ඌරා, ලේ මාපිලා, මී මැස්සා ආදී අනතුරුදායක සතුන් වනාන්තර ප්‍රදේශයේ ගැවසිය හැක. මීට අමතරව වලස් වඳුරා, දිය බල්ලා, කට කළු කටුස්සා, කට මුව කටුස්සා, වැලි මුවා, මුකලන් ලේනා, හඳුන් දිවියා, මුගටියා, කඳුකර උනහපුලුවා, හම්බාවා, මී මින්නා, මයිලගොයා, ලංකා අරංගයා, වැනි සතුන් රැසක් දිවි ගෙවයි. කළුගල්, අඩිපාර හා පොලොවේ ඇතැම් ස්ථාන ලිස්සන හා එරෙන සුළුය. හදිසි ගල් පෙරලීම් හා පස් කඩා වැටීමෙන් තුවාල සිදු විය හැක. මේ සියලු පරිසර තත්වවලට පෙර සූදානමක් ඇතිව ඇඳුම්, උපකරණ හා බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි.

**ඉතා වැදත් කාරුණික ඉල්ලීමයි**

මෙම මහඑළිය තැන්න හා කිරිගල්පොත්ත ආශ්‍රිතව මහවැලි , කැලණි, වලවේ යන ගංගා වල උපත සිදු වේ. මෙම ගංගා වල ජලය ප්‍රයෝජනයට ගෙන සිදුකෙරෙන කෘෂිකර්ම, පානිය ජලය ලබාගැනීම, විදුලිය ජනනය, සංචාරක කටයුතු ආදීය ඔබත් මටත් සෘජුවම බලපාන ඉතා වැදගත් කාර්යයන් වේ. එසේ නම් මෙම ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම ඔබගේත් මගේත් පරම යුතුකමයි. ඔබ හුදු විනෝදය සඳහා පමණක් එහි යන්නේ නම් මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේ උරුමයක් නිසා එය ආරක්ෂා කර ගතයුතු බවට නිරතුරු සිහිතබා ගන්න. වෙනත් කටයුත්තක් සඳහා එහි ගියද පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න. විශේෂයෙන් ගිනි දැල්වීමෙන් වලකින්න. සිගරට් භාවිතා නොකරන්න. සිගරට් කොට වැටීමෙන් තෘණ පඳුරු පහසුවෙන් ගිනිගනී. පැළෑටි, ශාඛ වලට හානි නොකරන්න. ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය ප්‍රදේශයට ගෙන යාම සීමා කර ඇත. ඒවා එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශවල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන සමස්ථ ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. ජලය හැර පරිසර පද්ධතියෙන් කිසිවක් ලබා නොගන්න. මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂාකර තබන්න. මෙය 'ලක් විස්කම්' ඔබෙන් කෙරෙන ඉතා බැගෑපත් ඉල්ලීමයි!

**මහඑළිය තැන්න ඉතිහාසය**

මෙම තැන්න වර්තමානයේ හෙක්ටයාර් 3160ක වපසරියකින් යුතු තෘණ භූමි හා වලාකුළු වනාන්තර සහිත අභය භූමියකි. දියුණු බලංගොඩ මානවයා අදින් වසර 31000 කට ප්‍රථම මෙම මහඑළිය අශ්‍රිතව ජීවත් වූ බවට පුරා විද්‍යා සාක්ෂි ලැබී ඇත. ආචාර්ය ශිරාන් දැරණියගල, ආචාර්ය රත්නසිරි ප්‍රේමතිලක වැනි විද්වතුන්ගේ පර්යේෂණ වලින් මේ බව තහවුරු වී ඇත. බලංගොඩ මානවයා දඩයම සඳහා භාවිතා කල බවට විශ්වාස කරන කුඩා ගල් ආයුධ මහඑළිය තැන්නෙන් හමු වී ඇති අතර ඔවුන් බල්ලන් හීලෑ කොටගෙන විසූ බවටද සාක්ෂි හමු වී ඇත. ඔවුන් ආහාර ලබා සඳහා සතුන් දඩයම් කර ඇති බව පෙනේ. ආචාර්ය රත්නසිරි ප්‍රේමතිලක මහඑළිය තැන්නේ පස් සාම්පල වලින් කරන ලද පරීක්ෂණ වලින් එකල හේන් ගොවිතැන් ක්‍රමයට භෝග වගා කර ඇති බව සොයාගෙන ඇත. මේ බෝග අතර කැලෑ සහල් වල පරාග හමු වී ඇති බවත් එමගින් ඔවුන් තැන්නේ වී වගා කරන්නට ඇති බවට සලකයි. මෙම පරාග රේඩියෝ කාබන් පරීක්ෂාවේදී මීට වසර 7000 කට (ක්‍රි.පූ. 5000) පෙර කාලයට අයත් බව තහවුරු කරගෙන ඇත. එසේම තොටුපොල කන්ද හා ෆාර් ඉන් බංගලාව අතර, එම බංගලාවට උතුරු දෙසින් වූ මඩ

www.Lakviskam.org

ගොහොරුවකින් ලබා ගත් පස් සාම්පල ආශ්‍රයෙන් කල පර්යේෂණ වලදී ධාන්‍ය වගා කිරීමට කැලෑ එළි කර ගිනි තබා ඇති බවත්, අදින් වසර 16000-17000 කට (ක්‍රි.පූ. 15000-14000) පෙර බලංගොඩ මානවයා ඕට්ස් හා බාර්ලි වැනි ධාන්‍ය වගා කල බවත්, සතුන් ගාල් කර ඇති කල බවත්, ක්‍රි. පූ. 8000-7000 කාලයේදී ඕට්ස්, බාර්ලි වගාවෙන් ක්‍රමයෙන් බැහැරවී වඩා දියුණු ලෙස කැලෑ වී වගාව සිදු කරන්නට ඇති බවත් සාක්ෂි සහිතව නිගමනය කර ඇත.

පසුව පුරාණ රජ දවස සිට ආරක්ෂිතව පැවති මහඑළිය තැන්න අත්හැර තිබී ඉංග්‍රීසි ජාතික ආණ්ඩුකාර රොබට් විලියම් හෝර්ටන් විසින් නැවත සොයාගත් බවට සැලකේ. එකල සිට මෙය හෝර්ටන් තැන්න ලෙස හැඳින් වුවද අපට උරුම නියම නාමය මහඑළිය තැන්නයි. මීට අමතරව මෙය මහතැන්න, මහවැලි තැන්න ලෙසද අතීතයේ හඳුන්වා ඇත. මීට අවුරුදු 30-40 කට පමණ පෙර මහඑළිය තැන්නේ අනවසර මැණික් ගැරීම් බහුලව සිදු විය. අතීතයේ එහි මැණික් හමුවූ පෙදෙස මැණික් පොකුණ ලෙස හඳුන්වා ඇත. මෙම තැන්නේ එකල අලි ඇතුන් පවා බහුලව සිටියත් එම සතුන්ට මෙම භූමිය අත්හැර යන්නට සිදුවූයේ ඉංග්‍රීසින්ගේ මහා අලි හා සත්ව සංහාරයයි. ක්‍රි.ව. 1873 උද්භිද විද්‍යාඥ මේ'ස් හුකර් මූලික වී මුහුදු මට්ටමෙන් අඩි 5000 ට වඩා උස් බිම් එළි කිරීම නවතාලීය. මේ තීරණය නිසා මහඑළිය වගා කටයුතු වලට යොදා ගැනීමෙන් අරක්ෂා වුවත් ක්‍රි.ව.1950-1969 කාලයේදී කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව විසින් අර්තාපල් වගා කෙරින. මෙයින් සිදු වූ ව්‍යසනය නිසා ක්‍රි.ව. 1969 දෙසැම්බර් 5 දින සිට හෝර්ටන් තැන්න ස්වභාවික රක්ෂිතයක් ලෙසත්, ක්‍රි.ව. 1988 මාර්තු 16 දින සිට ජාතික වනෝද්‍යානයක් ලෙසත් ප්‍රකාශයට පත් කෙරිණ. අද යුනෙස්කෝ ලෝක උරුමයක් වන මෙම තැන්න ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා තුනක ආරම්භය සිදුවේ. කිරිගල්පොත්ත කන්ද ආශ්‍රිතව ආරම්භවන දිය උල්පත්වලින් බෙලිහුල්ඔය ඔස්සේ වලවේ ගඟත්, බගවන්තලා ඔය, කෙහෙල්ගමු ඔය ඔස්සේ කැළණි ගඟත්, ආගර ඔය ඔස්සේ මහවැලි ගඟත් පෝෂණය කෙරේ.

රාවණා -රාම කතා පුවතේ ත්‍රිකූට කඳු ලෙස සැලකෙන්නේ පිදුරුතලාගල, තොටුපල කන්ද හා කිරිගල්පොත්තයි. රාවණා රජු සීතා දේවිය රැගෙනවිත් දඬුමොනරය මුලින්ම ගොඩ බෑ ස්ථානය මහඑළිය තැන්නේ පිහිටා ඇති තොටුපල කන්ද බවට ජන වහරේ එයි. දඬුමොනරය ගොඩබෑමේදී එයින් නිකුත්වූ විශාල එළිය නිසා මෙම තැන්න මහඑළිය වූ බවට මතයක් ජනවහරේ එයි. එසේම අතීතයේ මැණික් පතල්වලින් හමු වූ ඕවලාකාර හැඩති ඉතා මෘදු වූ පාෂාණ විශේෂයක් තිබී ඇත. කිසිදු රසයකින් යුක්ත නොවූ ඒවා රාවණා විසින් සීතා දේවියට දීමට සකස් කල බෙහෙත් ගුලි සහ අහාර විශේෂයක් බවට අදහසක් ගැමියන් අතර පැතිරී තිබූ බව කියවේ.

මෙවන් තවමත් හෙළි වෙමින් පවතින දීර්ඝ ඉතිහාසක් ඇති අපේ මහඑළිය තැන්නට එම නාමය අමතකර වර්තමානයේදී සුදු ජාතිකයන්ගේ හෝර්ටන් තැන්න යන නාමය භාවිතා කිරීම කෙතරම් සුදුසු වේද?

**ගමන ආරම්භ කරමු**

අප පෙබරවාරි 13 වන දින රාත්‍රීයේ බදුල්ල තැපැල් දුම්රියෙන් ඔහිය දුම්රිය ස්ථානය දක්වා යාමට සියල්ල සූදානම් කර තිබුනද එදින පෙරවරුවේ හදිසියේ ක්‍රියාත්මක කළ දුම්රිය සේවක වැඩවර්ජනය නිසා අප මහත් ව්‍යාකූල තත්වයකට පත් වූයෙමු. අප මිත්‍ර අරුණගේ අසනීප තත්වයක් නිසා ගමනට සහභාගී නොවීමට අවසාන මොහොතේදී ඔහු තීරණය කරන ලදී. කරුණු මෙසේ යෙදී තිබියදී අප තිදෙනා අවදානමක් ගෙන දුම්රියේම ගමන යාමට තීරණය කළෙමු. කාර්යාල වේලාවෙන් පසු රාත්‍රී ආහාරයට 'උළුඳු වඩේ' රැගෙන කොළඹ කොටුව දුම්රියපලට ගියෙමු. දුම්රියපල එකම හිස්ගොඩක් විය. බදුලු දුම්රිය ප්‍රමාද වී ධාවනය වන බව දැනගත් අප දුම්රිය වේදිකාවේ රැඳී සිටිමින් අහාර ගත්තෙමු. සිරිපා වන්දනාවට හා දිගු නිවාඩුවට සංචාරය කරන පිරිස් ඉතා විශාල ප්‍රමාණයක් එහි විය. වර්ජනය නිසා එදින රාත්‍රී 8 පැරණි තැපැල් දුම්රිය වෙනුවට නව S12 පන්තියේ දුම්රියක් 8.30ට පමණ වේදිකාවට ලගා විය. අප දෙවන පන්තියේ ප්‍රවේශ පත්‍ර මිලදීගෙන තිබුනත් දැඩි පොර කෑමකින් පසු ගොඩ වී තිබුනේ තුන්වන පන්තියේ මැදිරියකටය. ලසිත ගොඩවී තිබුනේ දෙවන පන්තියේ මැදිරියකට වුවත් ඔහුටද වාඩි වීමට ලැබී තිබුනේ නැත. දැඩිසේ තෙරපී පීඩා විඳිමින් පැය 6 කට අධික කාලයක් නොනවත්වා සිටගෙන යාමට අපට සිදුවිනි. සිරිපා වන්දනා කරන්නට යන "බැතිමතුන්"ගේ නානප්‍රකාර අසභ්‍ය වදන්, නොමනා ගීත ගයනා, පරිසරයට හානි කිරීම් සහ ඔවුන්ගේ සිගරට් දුම අක්‍රිය දුම්පානය කරමින් දැඩිසේ පීඩා විඳිමින් ගමන් කිරීමට සිදු විය. අපට වාඩි වීමට ලැබුනේ හැටන් දුම්රිය ස්ථානයෙන් මුළු මදිරියම අරක්ගෙන සිටි "බැතිමතුන්" පිරිස බැස ගත්පසුවය. පට්ටිපොළ දුම්රිය ස්ථානයට පසුව හමුවන ඔහිය දුම්රිය ස්ථානයෙන් අප බසින විට අලුයම 4.12 වී තිබුණි. මහඑළිය නොහොත් හෝර්ටන් තැන්න බලා යන තවත් කණ්ඩායමක් දුම්රියෙන් පැමිණ තිබුණි. අධික සීතල නිසා උණුසුම රඳවා ගැනීමට අත් මේස් හිස් ආවරණ ආදිය හැඳ පැළඳ ගත් අප තිදෙනා ටික වෙලාවක් දුම්රිය

www.LakViskam.org

ස්ථානයේ ගත කළෙමු. මේ අතර වාරයේ දුම්රිය ස්ථානයට ඉදිරියෙන් ඇති ගාමිණීගේ කඩය විවෘත කරන ලදී. අප වහා ඒ දෙසට ගියේ උණුවෙන් තේ කෝප්පයක් බීමටය. රොටී කා උණු තේ කෝප්පයකින් සප්පායම් වූ අපට මහඑළිය දක්වා යාමට ත්‍රිරෝද රථයක් කඩයේ මුදලාලි විසින් සූදානම් කර දෙන ලදී. තවමත් කරුවල නිසා ටික වේලාවක් ඔහිය ගමේ ගත කල අප අලුයම 5.15ට පමණ ත්‍රිරෝද රියෙන් කරුවලේම පිටත් වූයෙමු. රථයේ රියදුරා අතරමග වූ පත්තිනි දේවාලයට පහනක් පත්තුකර කන්ද නැගීම ආරම්භ කලේය.



අලුයම 4.15-ඔහිය දුම්රිය ස්ථානය


මහඑළියට හිරු උදා වීමට මොහොතකට පෙර

දවසේ මුල්ම හිරු රැස් මහඑළියට පතිතවන චමත්කාරය විඳ ගැනීමට අපි වාසනාවන්ත වූයෙමු. මෙම ගමනට මාස කිහිපයකට පෙර සිටම සූදානම් වූ අපි හෝර්ටන් තැන්න භූමියේ කදවුරු බිමක් බත්තරමුල්ලේ වනජීවී කාර්යාලයෙන් වෙන් කොට තබා ගත්තෙමු. ඊට අදාල ලියකියවිලි ඇතුල්වීමේ ගේට්ටුවට ඉදිරිපත් කිරීමෙන් නැවත ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමකින් තොරව හොර්ටන් තැන්නට ඇතුළු වියහැකි විය. ප්‍රධාන කාර්යාලය වෙත ගමන් කරන අතරතුර හිරු එළිය කෙමෙන් තැන්නට පතිත වන්නට විය. තැන්නේ සිටි විශාල ගෝනුන් රංචුවක්ද ජායාරූපයට නැගීමට අපට හැකි විය. ප්‍රධාන කාර්යාලයට මුලින්ම පැමිණියේ අප තිදෙනාය. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් අපට කඳවුරු භූමියේ හොදින් පිරිසිදුව පවත්වාගෙන යන වල වැසිකිලි නිදහසේ පාවිච්චි කලහැකි විය. මද වෙලාවක්  ගතවෙත්ම කාර්යාල භූමිය සංචාරකයන්ගෙන් පිරීයන්නට විය. අප එහි නිළධාරීන් සමග කතාබහ කර කූඩාරම ඇතුළු අනිකුත් අමතර බඩු කාර්යාල බිමේ ආරක්ෂිත තැනක තබා කිරිගල්පොත්ත නැගීමෙන් පසු කදවුරු බිමේ කූඩාරම් ගැසීමේ බලාපොරොත්තුවෙන් ගමනට අවශ්‍ය ඇදුම් ඇද ගතිමු. විශේෂයෙන් තැන්නේ ඇති 'යුරෝපීය කටු පදුරු' නම් ආක්‍රමණික කටු පදුරු විශේෂය නිසා කකුල් වැසෙන ඇදුමක් ඇද සිටීම වැදගත් වේ. කාර්යාල භූමියේ කිරිගල්පොත්ත කන්ද පිහිටා ඇති දිශාව හා විස්තර පුවරුවක දක්වා ඇත. එහි සිට කන්දට දුර 7km පමණ වේ. එනම් සම්පූර්ණ ගමනේ දුර 14 km පමණ වේ.

කන්ද තරණය කර ආපසු ඒමට සාමානයෙන් පැය 6-8ත් අතර කාලයක් ගත විය හැක. කැලය මැදින් දිවෙන අඩි පාරක් දක්නට ඇති අතර සමහර ස්ථාන වලදී එය අපැහැදිලි වන අතර එය විවිධ දිශාවලට බෙදී ගමන් කරයි. ඒවා බොහොමයක් පෙරකල භාවිතා කල ඒවාය. ගමන් මාර්ගයේ මුල් කොටස එතරම්ම අපහසු එකක් නොවේ. එහෙත් අඩි පාරේ ඇතැම් තැන් ලිස්සන හා එරෙන සුළු නිසා පය ලෙස්සා වැටීමට ඉඩ ඇත. කන්දේ අවසන් කොටස ඉතා අනතුරුදායක ස්වභාවයකින් යුක්තයි.  කිරිගල්පොත්ත යනු ශ්‍රී ලංකාවේ කදු අතරින් උසින් දෙවන තැන ගන්නා කන්ද වේ. එහි උස මුහුදු මට්ටමේ සිට මීටර් 2395 යුක්ත වේ. මෙම කන්දේ එක පසකින් ඇති කළුගල් තලාවක් මතට හිරු එලිය වැටීමෙන් එය සුදු පැහැයෙන් දිස් වන නිසා කිරිගල් පොත්ත යන නාමය ලැබී ඇති බවට මතයක් පවතී. මෙම කන්ද ආශ්‍රිත වනාන්තර වල ගෝනුන්, වළිකුකුලන් ආදී සතුන් ගැවසෙන නිසා දිවියන් බහුලව ජීවත් වේ. එම නිසා අදුර වැටීමට ප්‍රථම එය තරණය කර ආපසු පැමිණීම ඉතා වැදගත්ය. එසේම තනි තනියෙන් ගමන් නොකර ශබ්ද නොනගා කණ්ඩායමක් වශයෙන් නිතර ගමන් කිරීමද ඉතා වැදගත් වේ. අතරමග ජලය ලබා ගැනීමට සුදුසු විශාල දිය පහරවල් අඩු නිසා අවශ්‍ය පමන ජලය, කෑම හා බෙහෙත් ආදිය රැගෙන යාමට අමතක නොකරන්න. පෙබරවාරි මාසයේදී  මහඑළියට වැසි අඩුවෙන් ලැබෙන කාලයක් නිසා තැන්න වියලි ස්වභාවයකින් යුක්ත වේ. එහි සංචාරයට ඉතා සුදුසුම කාලයක් ලෙස පෙබරවාරි මාසය සැලකිය හැක.

www.LakViskam.org



ගෝනුන් තෘණ බුදිමින්



කැලය මැදින් පෙරට

හිරු නැගෙත්ම එතෙක් පැවැති තද ශීතලද ක්‍රමයෙන් පහව යන්නට විය. කලින් සඳහන් කල කටුපදුරු නිසා සුළු සීරීම් තුවාල ලබා එම ප්‍රදේශ පසු කල අප එළිමහන් තැන්න පසු කර වනාන්තර ප්‍රදේශයකට ඇතුළු වූයෙමු. එක්වරම අප අසලින් සතෙකු කෑ ගසන රළු මහා ශබ්ධයකින් අප තිගැස්සී ගියෙමු. ඒ ගෝනකු බවට අපට අවබෝධ විය. ශබ්ද නොනගා ඉතා සූක්ෂම ලෙස ඒ දෙසට බඩ ගා ගියේ එම ගෝනා සමීප ජායරූපයකට හසු කර ගැනීමටයි. එහෙත් ඔවුන් අපට වඩා සංවේදී නිසා එක්වරම ගෝනුන් රංචුවක් කැලෑව ඇතුලට ක්ෂණිකව දුව ගියේ අපවද බියට පත් කරවමිනි. නැවත ඉදිරියට ඇදුනු අපට මී වදයකින් නැගෙන්නාක් වැනි ශබ්ධයක් ඇසෙන්නට විය. නිසොල්මනේ විපරම් කර බැලුවත් ඒ ශබ්ධය එන ස්ථානය සොයා ගැනීමට අපහසු විය. ඇතැම්විට එය මලකුණකට වැසූ නිල මැස්සන්ගෙන් නැගෙන හඩක් විය හැකියයි අනුමාන කළෙමු. වනාන්තර පෙදෙසෙන් එලියට ආ විට හමු වුයේ ඉතා අලංකාර බෙලිහුල් ඔය හරහා වලවේ ගඟ බලා ගලා යන ජල පහරයි. එහි නොඉඳුල් සීතල ජල පොදකින් පිපාසය නිවා ගත් අපට ජල පහරට උඩින් දකුණු පසට දිවෙන අඩිපාර ඔස්සේ ඉදිරියට ඇදුනෙමු. මේ ආශ්‍රිතව තවත් පාරක් ඇති අතර එය ඔස්සේ ගමන් නොකර දකුණු පසට දිවෙන මාර්ගයේ යා යුතුය. අනෙක් මාර්ගය අතීතයේ අශ්වයින් පිටේ කැලයෙන් අනෙක් පැත්තට යාමට යොදා ගත් මාර්ගයක් යයි පැවසේ. මෙම පෙදෙසේ පස් තද කළු පැහැති වන අතර පිළිස්සුනු අමුතු හැඩයේ පාෂාණ, මැටි වැනි කොටස්ද දක්නට ලැබේ. තැන්නේ මෙම හියුමස් පස කළු පැහැගැන්වී තිබීම පිලිබඳව මෙවන් අදහසක් ජනවහරේ ඇත. එනම් රාවණා - රාම යුද්ධයේදී භාවිතා කල අවි වල ප්‍රබලත්වය හේතුවෙන් මෙම පස මෙසේ පිලිස්සී කළු පැහැ ගැන්වී ඇති බවයි.

www.Lakviskam.org



වලවේ ගඟ බලා යන දිය පහර



කළු පැහැති හියුමස් පස

තවත් ඉදිරියට යද්දී කුරු බට පඳුරු සහිත කැලෑ පෙදෙසක් හමු වේ. මෙම වනාන්තරය තුල දිවියන්ගේ හා ගෝනුන්ගේ අඩි සලකුණු දක්නට ලැබුණු අතර වනාන්තරය පුරාම තැනින් තැන වළි කුකුලන් තරගයට මෙන් කෑ ගසනු අසන්නට ලැබුණි. වළිකුකුලන් සැගවෙමින් කෑ ගැසීමට රුචි නිසා පැහැදිලිව දැක බලා ගැනීමට තරමක් අපහසුය. වනාන්තරය පුරා නෙළු මල් පොහොට්ටු දක්නට වූ අතර වළි කුකුළන් මෙම නෙළු මල් ආහාරයට ගැනීමට ප්‍රිය කරයි. අධික ලෙස නෙළු මල් සහ එහි ඇට ආහාරයට ගත් විට වළි කුකුළන් මත්වී බිම වැටී සිටී. මීට මාස කිහිපයකට පෙර මුළු හෝර්ටන් තැන්න පුරාම අධික ලෙස නෙළු මල් පිපී  තිබු අවස්ථාවේ මෙය සුලබ දසුනක්

විය. වනාන්තරය තුල නිල් මොණරැස්ස, සීතා පේර, අලිකන්, වල් කුරුඳු, බෝවිටියා, වැල් කපුරු, ගිනි හොට, කුරු උණ ආදි ශාඛ දක්නට ලැබේ. පෙද පාසි, මහා රාවණා රැවුල, හරිත ඇල්ගී, කඳු ලැස්ස, හාතාවාරිය ආදියද දක්නට ඇත. නැවතත් එලිමහන් ගමන් මාර්ගයකට පිවිසි අපට කිරිගල්පොත්ත කන්ද ඈතින් දර්ශනය විය. මී වද, මහරත් මල් සුලබව දක්නට හැකි මෙම ප්‍රදේශය තුල තවත් ඉතා අලංකාර මල් වර්ග දක්නට ඇත.


පඳුරු අතරින් විහිදුන අඩිපාර


කිරිගල්පොත්ත බෑවුම

කුඩා දිය පහරක් සමග වූ කළු ගල් තලාවක් ඔස්සේ තීව්‍ර නැග්මක් පසු කල අප ජීවනී හා ග්ලූකෝස් පානය කර ප්‍රබෝධමත් වූයෙමු. මෙම ප්‍රදේශයට ආසන්නයෙන් උස් ගල් මත කළු උකුස්සෙකුගේ කූඩුවක් දක්නට වූ අතර ඌ තම පැටවුන්ට කෑම ගෙන එන අයුරු නිරීක්ෂණය කළෙමු. මෙම ස්ථානයට ඊසාන දෙසට බරව අඹේවෙල සුළං විදුලි ටර්බයින පැහැදිලිව දැකිය හැක. තවත් ඉහලට යාමේදී මහා එළිය තැන්න පැතිරී ඇති ආකාරය හොඳින් දර්ශනය වේ. කන්දේ මුදුනත යයි හැඟෙන කුඩා ගල් තලාව වෙත ගිය පසු කන්දේ අවසාන කොටස දර්ශණය වේ . මෙම ගල් තලාව ඉදිරියෙන් ඇත්තේ ඉතාමත් දළ බෑවුමක් වන අතර මෙම ස්ථානයේදී ඉතා ප්‍රවේශම් විය යුතුය. කන්දේ ඉතිරිකොටස පටු ස්ථානයකින් නැග්මක් සහිත වන අතර තද මීදුම, සුළං, වැසි ඇති අවස්ථාවලදී ඒ හරහා යාම ඉතා අනතුරු දායක විය හැක. ප්‍රථමයෙන් එම අවසන් කොටස තරණය කල මාහට විනාඩි 5 ක පමණ ගමනකින් එනම් පෙ.ව. 11.30 වන විට වනාන්තරයට මැදි වූ ඉතා දර්ශනීය ශ්‍රී ලංකාවේ දෙවන උසම කඳු මුදුනට ළඟා වීමට හැකි විය. අනතුරුව ලසිත ද කඳුමුදුනට ලඟා විය. අවට හෝර්ටන් තැන්නේ අසිරිය හොඳින් කඳු මුදුනට දර්ශනය විය. හාත්පස විහිදුනු ඝන වනාන්තර හා අග්‍රා බෝපත් කඳු, තොටුපොල ඇතුළු කඳු වැටී හොඳින් දර්ශනය විය. කඳු මුදුන මහරත් මල් ගස් මලින් පීරී තිබුණි. මෙම ඉහල කඳු මුදුනට පවා ගෝනුන් වැනි සතුන් පැමිණෙන බවට සලකුණු දක්නට විය. අප විනාඩි 45ක් පමණ කඳු මුදුනේ ගත කර ආපසු බැසීම ආරම්භ කළෙමු.

www.LakViskam.org



දෙවනඋස් කඳුමුදුනේ උස්ම ස්ථානයේ ගිමන් හරිමින්



විමිනි පොකුණ අසල කූඩාරම සවිකර

එදින මුලින්ම කඳු මුදුනට ළඟා වුයේ අප තිදෙනාය. අප පහලට යන විට කඳු මුදුන බලා යන තවත් කණ්ඩායම් 4ක් හමු විය. අපට පෙර කී මාර්ගය ඔස්සේම විවේක ගනිමින් හොර්ටන් තැන්න කාර්යාල භූමියට ළඟාවීමට වීමට සවස 3 පමණ විය. එහි ආපන ශාලාවේ කුසගිනි නිවාගැනීමට සුදුසු දෙයක් නොවුයෙන් රොටි කිහිපයක් ඇනවුම් කර පැයක් පමණ බලා සිටීමට සිදුවිය. තුලසිදාස් එහි ආපනශාලාවේ නතරකොට ලසිත හා මා සියළු බඩු බාහිරාදිය රැගෙන විමිනි ඇල්ල අසල වූ අංක 3 කඳවුරු බිමෙහි අප කූඩාරම සවි කළෙමු. මෙම කඳවුරු බිම ඉතාමත් අලංකාර දර්ශන තලයක් සහිත එකක් විය. මිලට ගත් රොටී කූඩාරම අසල එළිමහනේදී අනුභව කළෙමු. අනතුරුව රාත්‍රී ආහාරය පිළියෙල කිරීමට සූදානම් වූයෙමු.

www.Lakviskam.org



භූමිතෙල් ලිපේ රාත්‍රී ආහාරය පිසිමින්



පුරහඳ මෝදු වෙමින්

කඳවුරු භූමියේ ගිනිමැල දැල්වීම තහනම් බැවින් කොළඹ සිට ගෙන ගිය භූමිතෙල් ලිප ඒ සඳහා යොදා ගතිමු. විමිනි ඇල්ලේ අධික සීතල ජලයෙන් ඇග පත සෝදාගත් අප සීතලට ඔරොත්තු දෙන ඇඳුම් ඇඳ උණුසුම් තේ කෝප්පයකින් සප්පායම් වී රාත්‍රී ආහාරය සකස් කළෙමු. එදින පුරපසළොස්වක පොහොය දිනයක් වුයෙන් හඳ එළිය නොඅඩුව ලැබුණි.සඳ එළියේ කඳවුරු බැඳීම අපටද නවමු අත්දැකීමක් විය. රාත්‍රී 7.30 පමණ විට එතෙක් පැහැදිලිව තිබු තැන්න මීදුමෙන් වැසී ගියේය. රාත්‍රිය අධික ශීතල සහිත වුයෙන් කූඩාරම තුල අහාර ගෙන පසු දින තොටුපල කන්ද නැගීමේ බලාපොරොත්තුවෙන් නින්දට ගියෙමු. ගෝනුන් කූඩාරම අසලින්ම කෑගසන ශබ්දයත් විමිනි පොකුණේ ජලය පහලට ගලා යන ශබ්දයත් අතරේ තනිවූ අපට නින්ද ගියමුත් අධික සීතල නිසා වරින්වර අවදිවීමටත් ශීතලෙන් පීඩා විදීමටත් සිදු විය. අපගේ කිරිගල්පොත්ත තරණය මෙසේ නිමා විය.

## කිරිගල්පොත්ත ගැන සඳහන් වන විශේෂ කවි කිහිපයක්

දෝස්ත්‍ර මොහන්දිරම් වර්ණසූරිය ගුරුන් වහන්සේගේ පෞද්ගලික පුස්තකාලයෙන් උපුටා ගත් රාවණා සම්බන්ධව  හා කිරිගල්පොත්ත ඇතුළු තවත් කඳු ගැන කියවෙන කවි කිහිපයක් පහතින්.

සමනල රූව කෙටූ ගල සමනල කන්ද
හක්ගෙඩි රූව ඇති ගල හක්ගල කන්ද
තලමල කොටා ඇත උස තලගල කන්ද
බඹර රූව ගලේ ඇති බඹරා කන්ද

නුගපොළ කිරිකටිය සහ එක්ගස් කන්ද
යක්කුන් සතු නිධන් ඇති මහ කන්ද
කොටපොළ කන්ද මහදිග බට දඬු කන්ද
නිධන් වස්තු තවඇත සීගිරි කන්ද

කිකිළිගේ රූපයක් ඇත කිකිළිය මානේ
රාවණ සිරුර ඇත මහකුඹුගල මුදුනේ
ඇටි කුකුලෙකුගෙ රූව ඇටිපොළ කඳු මුදුනේ
ඊතලයක ලකුණ ඇත ලග්ගල මුදුනේ

නිල්ගල කඳුවැටිය විභිසනගේ පෙදෙස
කිරිගල්පොත්ත නියඳගොඩ රවුලුගේ පෙදෙස
රම්බොඩ වැදිමලේ සූරිය පිදූ පෙදෙස
මේසැම පෙදෙස විය යක්කුන්ගේ පෙදෙස

ඔමරාගොල්ල මහ ආයුධ ගබඩාව
නමුණුකුලය සගවා ඇත යගදාව
රක්වානේ කඳුමුදුනේ සිරියාව
මහවෙද නිධානය ගනු නොපමාව

කබරගේ රූව කොටා ඇති කබරාගලය
රක්වන කඳුමුදුනේ රාවණ කිරීටය
මොරොන් කන්දමුදුනේ මහ නිධානය
අක්ෂර කෙටූගල පණ්හිඳ නිධානය

www.LakViskam.org

**19 වන සියවසේ අග භාගයේදී පමණ බිහි වූ පැරණි කරත්ත කවියක්**

කලු ගල් තලාලයි පාරට දමන්නේ
එම ගල් පැගිලයි ගොන් කුර ගෙවෙන්නේ
ගොනා නොවෙයි හරකයි බර අදින්නේ
කිරිගල්පොත්ත කන්දයි මේ අදින්නේ

අප සංචාරයේ තවත් ඡයාරූප එකතුවක් මෙතනින් නරඹන්න

https://picasaweb.google.com/102500057347588371605/KirigalpoththaViaMahaeliya2014?authuser=0&feat=directlink

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්” වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org (02-අප්‍රේල්-2014)

විමසීම්: lakviskam@gmail.com

මහඑළිය ඓතිහාසික කරුණු ලබා ගත් මූලාශ්‍ර: විද්‍යා ගවේෂණ" බ්ලොග් අඩවිය http://vidya-gaweshana.blogspot.com

රාවණා කවි උපුටා ගැනීම: 2010 ජනවාරි 6 දින "හෙළ යුගය" බ්ලොග් අඩවිය පල කල ලිපියකින් http://helayugaya.blogspot.com